# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2082/31 - 2018 අගෝස්තු මස 01 වැනි බදාදා - 2018.08.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2018 අගෝස්තු මස 01 වැනි දින සිට ආරම්භ වන මාස 02 ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2018.05.08 දිනැති අංක 2070/02 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් මාළු සහ 2018.06.14 දිනැති අංක 2075/31 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් තලපත් මාළු, කොප්පරා මාළු සහ තෝරා මාළු සඳහා ප්‍රකාශිත අදාළ නියමය 2018 අගෝස්තු මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 ජූලි මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| | *I වැනි තීරය* | | *II වැනි තීරය* |
|---|---|---|---|
| | *වෙළඳ භාණ්ඩය* | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං. ව. ශීර්ෂය* | *විස්තරය සංකේතය* | |
| 01. | 03.02 | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, අළුත් හෝ ශීතකළ මසුන් | කි. ග්‍රෑමයට රු. 25 |
| | 03.03 | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, හිමායිත මසුන් | කි. ග්‍රෑමයට රු. 25 |

08 - 564


1A - PG 4154 — 532 (2018/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*